**බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කල මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-----------------------------------------

1.3.1. ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයට අදාල අක්කර බදු අධි ගාස්තු රු. 53,707 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දක්වා තිබීම නිසා වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ වලට අදාල උසාවි දඩ මුදල් ලැබීම් රු. 2,122,264 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල අඩුවෙන් හා සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලට අදාල මුද්දර ගාස්තු රු. 2,036,262 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබීම නිසා සමුච්චිත අරමුදල අඩුවෙන් හා සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ ණයහිමි අධි වෙන්කිරීම රු. 232,522 ක් වුවත් එය රු. 265,427 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමුච්චිත අරමුදල රු. 32,905 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) කෑගල්ල හා රුවන්වැල්ල අධිකරණ වලින් 2017 වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 3,832,657 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ලැබිය යුතු කඩ කුලී රු. 635,550 ක් ගිණුම්ගත නොකිරීම නිසා ලැබිය යුතු ආදායම් හා වර්ෂයේ කඩ කුලී ආදායම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2017 වර්ෂයේ කර්මාන්ත ආධාර වශයෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු රු. 12,004,636 ක් ණය ගැතියෝ හා ණය හිමියෝ යටතේ දක්වා නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් ගිණුම්වල එකතුව වූ රු. 75,130,089 ක් වූ නමුත් ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු. 75,161,289 ක් වූයෙන් වෙනස රු. 31,200 ක් විය.

(ආ) ගිණුම් විෂයයන් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 5,948,375 ක් වූ නමුත් ඊට අදාළ උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.8,227,642 ක් වූයෙන් වෙනස රු. 2,279,267 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.2,962,081 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ එකක කාලයක් ඉක්මවූ ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,662,247 ක් විය.

1.4 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු.රෙ. 371 (ආ) | 104,038 | සෑම අත්තිකාරමක්ම අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් 2012,2016,2017 වර්ෂවල අවස්ථා 04 කදී ලබා දී තිබූ අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ii) මු.රෙ. 371 (ඇ) | 161,500 | තත්කාර්ය අත්තිකාරම් අදාළ කාර්යය අවසන් වූ වහාම ඉතිරි වූ මුදල එදිනම හෝ ඊළඟ වැඩ කරන දිනයේදී පියවිය යුතු වුවද 2017 වර්ෂයේදී අවස්ථා 10 කදී ලබා දී තිබූ අත්තිකාරම් 2018 ජනවාරි වනවිටත් පියවා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (iii) 396 (ඇ) | 5,955 | නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (iv) මු.රෙ. 571 | 680,629 | 2011 වර්ෂය සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ තැන්පත් කර වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු වාහන 07 ක් සඳහා වර්ෂ 2 සිට වර්ෂ 7 ක් දක්වා වූ කාලය තුළ ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) | අංක 10/98(i) හා 2013 මාර්තු 31 දිනැති සබරගමු පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය | 9,815 | නිලධාරීන් 04 දෙනෙකුට අදාළව අයවියයුතු ඇප මුදල් අඩුවෙන් අයකර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,680,855 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,443,871 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම - | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,445,560 | 1,767,982 | 1,915,280 | 108,979 | 1,404,954 | 1,462,796 | 1,362,586 | 201,599 |
| (ii) | කුලී | 1,757,300 | 1,966,217 | 1,442,752 | 523,465 | 1,448,400 | 1,736,745 | 1,736,745 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 362,700 | 259,532 | 259,532 | - | 322,000 | 238,886 | 255,126 | - |
| (iv) | වෙනත් ආදායම් | 38,612,644 | - | 27,503,624 | - | 35,555,131 | - | 25,937,354 | - |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, සියයට 32 කින් වැඩි වී තිබූ අතර කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 18,28 හා 27 කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

------------------

සභාවට අයත් වරිපනම් දේපල 2009 වර්ෂයේදී යටියන්තොට ප්‍රාදේශීය සභාවෙන් පවරා ගෙන තිබුණු අතර වරිපනම් ඒකක 1,620 ක් අතරින් ඒකක 640 ක 2016 වර්ෂයේ සිට නව තක්සේරුව මත බදු අය කිරීමට කටයුතු කර තිබුණද ඉතිරි ඒකක 980 කින් තවදුරටත් 2009 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 04 කට අදාලව ආරක්ෂක බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපාර ආයතන 05 කට අදාලව සමාලෝචිත වර්ෂයට ව්‍යාපාර බදු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

----------------------------------------------------

බුලත්කොහුපිටිය නගරයේ සතිපොල භූමිය සංවර්ධනය කිරීම 2014 ජනවාරි මාසයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණද 2018 මැයි වනවිටත් එම සතිපොල ඉදිකිරීම් නිමකර නොතිබුණි. තවද සතිපොල පැවැත්වීම සඳහා දිනකට රු. 5,000 බැගින් ගෙවා භූමියක් කුලියට ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ රු. 260,000 ක් වැයකර තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් දක්වා රු. 980,000 ක් වැයකර තිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

----------------------------

2016 දෙසැම්බර් 31 දිනට සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වී තිබුණු රු. 22,000 ක් වටිනා භාණ්ඩ වර්ග දෙකක ඌනතාවය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

2017 අයවැය ලේඛනය මගින් ඇතිකළ ප්‍රතිපාදන වලින් අවස්ථා 82 කදී එකතුව රු.27,917,400 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු අතර වැය විෂයන් 21 කට අදාලව සියයට 76 සිට සියයට 99 දක්වා වූ පරාසයක ඉතිරිකිරීම්වල එකතුව රු.130,940,550 ක් විය.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ජ,නල් සටහන් වල සංඛ්‍යා නිවැරදි නොවීම.<br>(ii) උපලේඛන ගිණුම් සමඟ නොසැසඳීම<br>(iii) දිගු කාලීන ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම<br>(iv) ආදායම් වියදම්,වත්කම් හා බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම් ගත කිරීම |
| (ආ) අයවැය පාලනය | (i) සැලකිය යුතු ප්‍රමාණයන්ගෙන් ප්‍රතිපාදන ඉතිරිකර තිබීම<br>(ii) ඇස්තමේන්තු ආදායම් අයකර නොගැනීම |
| (ඇ) ආදායම් පරිපාලනය | (i) වරිපනම් අයකිරීම සඳහා දියුණු ප්‍රදේශ හඳුනා නොගැනීම<br>(ii) හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම. |
| (ඈ) වාහන උපයෝජනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම<br>(ii) වාහන වල ඉන්ධන පරීක්ෂාව සිදු නොකිරීම<br>(iii) සභාව භාවිතා කරන වෙනත් ආයතන සතු වාහන පවරා ගැනීමට කටයුතු නොකිරීම<br>(iv) ඌණ උපයෝජිත වාහන පැවතීම |